00487

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව – 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2021/2022

පරිසර නීතිය – LLU5811/LWU3314

කාලය – පැය තුනයි (3)

---

දිනය: 2023 ජනවාරි 24 | වේලාව:පෙ.ව.9.30-ප.ව.12.30

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

අවසර නොලත් ලිපි ලේඛන, ජංගම දුරකථන හෝ වෙනත් විද්‍යුත් උපාංග විභාග ශාලාවේ තබාගැනීම විභාග වරදකි.

පලමු කොටසේ ප්‍රශ්න අංක 1 ට හා දෙවන කොටසින් ප්‍රශ්න තුනකට පිලිතුරු සපයන්න.

I කොටස – මෙය අනිවාර්ය ප්‍රශ්නයකි (ලකුණු 40)

1. දිවයින නම් වූ දූපත රාවණාරටේ බටහිර දිග වෙරලබඩ පිහිටියා වූ වැසියන් 600 දෙනෙක්ගෙන් සමන්විත වූවකි. මෙම වැසියන්ගේ ජීවනෝපාය සමන්විත වී තිබෙන්නේ ධීවර කර්මාන්තයෙන් හා පොල් වගාවෙනි. මෑත වසරවල සිට, සංචාරකයන් තල්මසුන් නැරඹීම සඳහා ගෙන යන සංචාර සංවිධානය කිරීම තුලින් හරිත-සංචාරක කර්මාන්තය මගින් විශාල වශයෙන් මුදල් ඉපයීමට දූපත්වාසීන් යොමු වී සිටිති. රම්සාර් තෙත් බිමක් ද වන වැවක වසන්නා වූ පක්ෂීන් බැලීම පිණිස පැමිණෙන සංචාරකයන් සඳහා ගෙවල් කුලියට දීමෙන් ද ඔවුන් ආදායම් ලබති. මෙම වැව වසරේ සමහර කාලයන් හි සංචාරක පක්ෂ විශේෂයන්හට ද වාසස්ථානයක් වේ. මෙම වැව රාවණාරට සත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ ස්වභාවික රක්ෂිතයක් ලෙස ද ප්‍රකාශයට පත් කොට තිබේ.

රාවණාරට බටහිර වෙරල අසබඩ ඩොල්ෆින් මත්ස්‍යයන් වන බවට මෑතක දී අනාවරණය කරගන්නා ලදී. මෙලෙස අනාවරණය කරගත් ඩොල්ෆින් විශේෂයන් අතර ලෝකයේ ඉතිරි වී සිටින වඳ වී යාමේ තර්ජනයට ලක්ව සිටින සත්ව විශේෂ කීපයක් අතර වන ඩොල්ෆිස් සත්වයන් ද වූහ. මෙම ප්‍රදේශය මෙම සත්වයන් බෝ වන පෙදෙසක් බවට පත්ව තිබෙන බවට විශ්වාස කෙරේ. 2021 වර්ෂයේ දී මෙය රාවණාරට වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ සමුද්‍රීය අභය භූමියක් ලෙස නම් කෙරුණි.

මාස කීපයකට පෙර විදේශ කැණීම් සමාගමක් දිවයින හි විශාල වශයෙන් ඉල්මනයිට් නිධි පවතින බවට සොයා ගත්තේය. ඉල්මනයිට් කැණීම සඳහා මෙම සමාගම සමග ගිවිසුමකට ඇතුලු වීමට ආණ්ඩුව යෝජනා කරයි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධව පාරිසරක බලපෑම් තක්සේරුවක් තවමත් සිදු කොට නැති වුවත්, අදාල රජයේ අධිකාරිය විසින් නිකුත් කල ප්‍රකාශනයක මෙලෙස සඳහන් විය :

(අ) රාවණාරට බංකොලොත් වී තිබෙන තත්වයක් තුල ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය

මුදලක් ලැබෙන තෙක් රට පවත්වා ගෙන යාම සඳහා ආදායම් අවශ්‍ය බැවින් මෙම ව්‍යාපෘතිය අත්‍යවශ්‍ය වේ.

(ආ) ඉල්මනයිට් පවතින්නේ දිවයින දූපතේ පමණක් වන නිසා ව්‍යාපෘතියට අදාල ප්‍රායෝගික විකල්ප නොමැත.

(ඇ) ඉල්මනයිට් ගවේෂණය හා කැණීම සඳහා පෞද්ගලික ඉඩම්වලට ප්‍රවේශ වීමක් සිදුවන්නේ එම ඉඩම්වල අයිතිකරුවන්ගේ අවසරයට යටත්වය.

(ඇ) ධීවර කර්මාන්තය හා සංචාරක කටයුතු බඳු අස්ථිර ජීවනෝපාය වෙනුවට ස්ථිර රැකියා දූපත්වාසීන් වෙත තහවුරු කෙරෙන බැවින් ව්‍යාපෘතිය ඔවුන් වෙත ප්‍රතිලාභසහගත වේ.

(ඉ) මෙම ව්‍යාපෘතිය රටේ ආර්ථිකයට තීරණාත්මක වන බැවින්, ගැසට් පත්‍රයක් මාර්ගයෙන් එය පාරිසරික බලපෑම් තක්සේරුවක් සිදුකිරීමේ අවශ්‍යතාවයෙන් ව්‍යාපෘතිය නිදහස් කෙරෙනු ඇත.

ඔබ අධ්‍යයනය කොට තිබෙන පරිසර නීති මූලධර්ම, මානව හිමිකම් මූලධර්ම, අධිකරණ තීරණ හා පනත්වල පසුබිම තුල මෙම ප්‍රශ්නය තුල මතු වී තිබෙන කරුණු සාකච්ඡා කරන්න. රාවණාරට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හා සියලු නීති ශ්‍රී ලංකාව හා සර්වසමාන බවට උපකල්පනය කරන්න.

**II** කොටස - මෙම කොටසින් ප්‍රශ්න තුනකට පිලිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයක් සඳහාම ලකුණු 20 ක් ලබා දෙනු ලැබේ.

2. *අන්තර්ජාතික හා ජාතික මට්ටම් තුල පරිසර ප්‍රශ්න හා මානව හිමිකම් අතර තිබෙන අන්තර්-සම්බන්ධය වැදගත් නඩු තීන්දු නීතියක උද්ගත වීම කෙරෙහි හේතු වී තිබේ. හරයාත්මක වශයෙන් පාරිසරික ප්‍රශ්නවලට අදාල වූ නඩු කටයුතු දේශීය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවන්හි මූලික අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රතිපාදන මත පදනම්ව සිදු කෙරෙනු බොහෝ විට දක්නට ලැබේ. අනෙක් අතට, පාරිසරික නඩු මානව හිමිකම්හි සංවර්ධනය හා ප්‍රසාරණය සඳහා හේතු වී තිබේ:*

ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල අධිකරණ විසින් විනිශ්චිත නඩු උදාහරණ කොට ගෙන, මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

3. රාමපුර ප්‍රාදේශීය සභාව ප්‍රදේශවාසීන්ගෙන් එකතු කරගන්නා කුණු නගරයේ මායිමේ පිහිටි භාවිතා නොකල කුඹුරක් වෙත බැහැර කිරීම ආරම්භ කලේය. කාලයත් සමග කුණු ගොඩ විශාල වීම පටන් ගත් අතර, ආහාර සොයමින් ගවයන් හා ඌරන් බඳු විවිධ සතුන් කුණු කන්ද වෙත එන්නට වූහ. වැඩි කල් නොයා, කැලයේ සිට වල් අලින් ද ආහාර සොයා මෙම පරිශ්‍රයට ඒමට පටන් ගත්හ.

කුණු කන්ද යාබද පදිංචිව සිටි ප්‍රදේශවාසීන් විවිධ ආකාරවලින් පීඩාවට පත්වූහ. කණුවල ගඳ ඉවසා ගත නොහැකි තත්වයක් ඇති වූ අතර ඔවුන් සෑම විටම තම ගෙවල් හා ජනේල වසාගෙන සිටියහ. කුණු කන්ද ගොඩගැසීම පටන් ගෙන වසරකට පමණ පසුව ළමුන් තිදෙනෙක් ඩෙංගු රෝගයට ගොදුරු වූහ. වල් සතුන්ට තිබෙන බිය නිසා ළමුන්ට තම නිවෙස්වලින් පිටත සෙල්ලම් කිරීමට නොහැකි විය. පසුගිය සතියේ කුණු කන්දට කෑම සොයා පැමිණි වල් අලියෙක්ගේ ප්‍රහාරයට ලක්ව කාන්තාවන් දෙදෙනෙක් මිය ගියහ.

කුණු දැමිය හැකි අනෙක් එකම ස්ථානය 5,000 ක පමණ ජනගහණයක් සහිත මුඩුක්කු

සහිත ප්‍රදේශයක් වන සීතාපුර නගරය බවට ප්‍රාදේශීය සභාව පවසයි. තවද, මෙම කුණු කන්ද පවත්වා ගැනීම සඳහා අවසරය ලබාදෙන පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තමුන් සතුව පවතින බවට ඔවුන් කියති.

මහජන පීඩාව ඇති කිරීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් පිරිසක් ප්‍රාදේශීය සභාවට එරෙහිව නඩුවක් ගොනු කොට තිබේ. ඔබ මෙම නඩුව විනිශ්චය කරන විනිසුරු යැයි උපකල්පනය කරන්න. මෙම සිදුවීම තුලින් මතුවන ගැටෙන කරුණු ඔබ විසින් විසඳන්නේ කෙසේදැ'යි පැහැදිලි කරන්න.

4. පාරිසරික යුක්තිය පිලිබඳ සංකල්පනය බිහි වූයේ එක්සත් ජනපදය තුල පරිසරය දූෂණයට ලක්කරන කර්මාන්ත විසින් ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභී හා සුලුතර වාර්ගික ප්‍රජාවන්ට අයත් ජනතාව මත සිදුකරන බලපෑමේ පසුබිම තුලය. කෙසේ වුවද, ශ්‍රී ලංකාව බඳු රටවල, මෙම සංකල්පය පරිසරය, සංවර්ධනය හා මූලික අයිතිවාසිකම් හා සබැඳි සියලු කරුණු වෙත ව්‍යාප්ත වී තිබේ.

මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ශ්‍රී ලංකාවේ හා වෙනත් අධිකරණ බල ප්‍රදේශවල නඩු නීතියේ පසුබිම තුල ඔබගේ ස්ථාවරය පැහැදිලි කරන්න.

5. සංශෝධනයට ලක් වූ **1988** ජාතික පාරිසරික පනත යටතේ එන දූෂණය පාලනය කිරීම හා පාරිසරික බලපෑම් තක්සේරු කිරීම සම්බන්ධයෙන් වන ප්‍රතිපාදන මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරය මත වන අහිතකර බලපෑම් නියාමනය හා කලමණාකරනය සඳහා වන වඩාත්ම වැදගත් වගන්ති වේ. කෙසේ වුවද, මෙම ප්‍රතිපාදන මගින් ඉටු කරගැනීමට අපේක්ෂා කල අරමුණු ඉටු වී නොමැති අතර ඒවා වඩා ඵලදායී කිරීමට නම් වහා සංශෝධනය විය යුතු වේ.

(අ) පරිසර දූෂණය පාලනය කිරීම හා

(ආ) පාරිසරික බලපෑම් තක්සේරුව යන කරුණුවලට අදාල ප්‍රතිපාදනවල දුර්වලතා හඳුනාගෙන වඩා කාර්යක්ෂම ලෙස පරිසරය කලමණාකරනය හා නියාමනය සඳහා මෙම ප්‍රතිපාදන සංශෝධනය කල හැක්කේ කෙසේදැ'යි යෝජනා ඉදිරිපත් කරන්න.

*හිමිකම් ඇවිරිණි*